Sannasa
244 Princes Hwy
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
**www.sannasa.com**
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**
**S Jayasinghe**
03 8707 4604
0402 025 516

**Anura Kulasekara**
0431 112 923
**email** ads.sannasa@gmail.com

**Account Details for Payments**

**Bank -** ANZ
**Branch -** 013312
**A/C number -** 254306608
**Name of A/C**
Sannasa News Group

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

| | |
|---|---|
| **NSW**<br>Lakshman<br>Kodituwakku | **WA**<br>Ven Beruwala<br>Sobhitha Thero<br>Sri Lanka Perth<br>Budhdist Vihara |
| **QLD**<br>Ananada<br>Samaratunga<br>2, Santorini Pl.<br>Forest Lake<br>QLD 4078<br>(07) 3372 7958 | **ACT**<br>Asoka Nimalasiri<br>0400 429 031<br>**SA**<br>Chandra Eeriyagama<br>08 8331 2318 |


පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත




# ජාතිය වනසන රූකඩ කල්ලි

ශ්‍රී ලංකාවේ වර්තමානය කිසිදු නිශ්චිත වැඩ පිළිවෙලක්, ඉලක්කයක් හෝ අරමුණක් නොමැතිව සියළු කටයුතු ක්‍රම ක්‍රමයෙන් හොරුන් දූෂිකයන් හා තක්කඩින්ගේ ග්‍රහණයට නතු වෙමින් පවතින කලක් බවට පත්වෙමින් තිබේ. නීතියද බලයද ක්‍රියාත්මකවන්නේ උන්ගේ අභිමතය පරිදිය. ගණින්නාන්සේලා ගේ කල්ලි වල බලය ද රටේ නීතියටද ඉහලින් යාම දක්වා තත්වය දරුණු වී ඇත . කමන් පෙනී සිටින තමන් යැපෙන බෞද්ධ දර්ශනය අමු අමුවේ උල්ලංඝනය කරන මේ සාදු කල්ලි වලට එරෙහිව රටේ ඇතැයි පැවසෙන සංඝ අධිකරණයෙන් හෝ කිසිවක් සිදුවන අයුරක් දක්නට නැත .

සංවේගයට කරුණ වන්නේ සියළු නොපනත් කම් සිදුවන්නේ ආගම හා දේශප්‍රේමය නමින් වීම ය. එය කොතෙක්ද යත් දැන් බුදුන් වහන්සේ පවා ශ්‍රී ලාංකියකු බවට පත් කර තිබේ.

ජාතිවාදය හා ආගම්වාදය යනු වහා ඇවිලෙන සුලු කාරණා ය. තිස් වසරක අපේ අත්දැකීම් හා ලෝක අත්දැකීම් ඒ ඇවිලවීම් වල ප්‍රතිඵල කවරාකාරදැයි අපට පසක් කර දෙයි. රට තුළ දෙමළ විරෝධයක් දැන් ගොඩනැගිය නොහැකි බැවින් සූක්ෂම ලෙස එය සහෝදර මුස්ලිම් ජනතාව දෙසට හරවා තිබේ. වෙළඳ ව්‍යාපාර වලින් පටන් ගෙන ඔවුන්ගේ සංස්කෘතික අයිතින්ට එරෙහිවීම දක්වා එය වර්ධනය වෙමින් පවතියි. මෙය කොතරම් සාපයක් ද?

අනාගතයේ ඇතිවිය හැකි තවත් ව්‍යසනයක් පිළිබඳව අපේ රටේ බුද්ධිමතුන්ගේ නිහඬතාව අදහා ගත නොහැකි ය. බොදු බල සේනා, සිංහල රාවය, රාවණා බලය වැනි නම් වලින් කරළියට නැගෙමින් තිබෙන්නේ කාගේ අවශ්‍යතා ඉටු කරන රූකඩ කල්ලිදැයි සැබෑ දේශප්‍රේමීන් රටේ ජනතාවට හෙළිදරව් කරමින් ඊට එරෙහිව කටයුතු කිරීමට පෙරමුණ ගත යුතු ය. නැතහොත් අපේ රටේ නමට හෝ ඉතිරිවී ඇති නීතිය හා සදාචාරය අපට සදහටම අහිමි වනු ඇත.

# සාධාරණය ඉටුකරනු

ශ්‍රී ලංකා ඉතිහාසයේ හමු වූ විශාලතම මිනී වල මාතලේ රෝහල් භූමියෙන් හමුවී තිබියදී වගකිවයුත්තන්ගේ නිහඬතාව අදහාගත නොහැකි තරම් ය. අහම්බයකින් මේ මිනී වල හමුවූ දා සිට එය වසංගන්නට වගකිවයුත්තන් දැක්වූ උනන්දුව රහසක් නොවේ. එකින් එක ගොඩ ගනිමින් තිබුණ ඇට සැකිළි එකසිය ගණන ඉංග්‍රීසීන්ගේ කාලයේ සිදුවූ වෙල්ලස්සේ කැරැල්ලට බැර කර සියල්ල වසා දමන්නට මේ අය කළ උත්සාහය හාස්‍ය ජනක ය. මේ හමුවූ ඇටදසැකිළි 1988 - 1990 කාලය තුළ මරා දමන ලද පිරිසකගේ බව විද්‍යාත්මක සාක්ෂි සහිතව ඔප්පු කරදුන් කොන්ද පණ තිබූ විද්‍යාඥයන් දෙදෙනාට පින් සිදුවන්නට අසත්‍යය යට වී සත්‍යයම ඉස්මතු වී තිබීම යහපතකි.

1988 - 90 කාලයේ රට පාලනය කළේ එක්සත් ජාතික පක්ෂයයි. ඒ කාලයේ නීතියට පිටින් මරා දැමුණ තරුණයන් වෙනුවෙන් පිනීවා ගියේ වෙනින් කවුරුත් නොව එවකට විපක්ෂයේ මන්ත්‍රීවරයකු වූ මහින්ද රාජපක්ෂ මහතායි. දැන් ඔහු රටේ පූර්ණ බලැති ජනාධිපති වරයා යි. ඔහුට කරන්නට නොහැකි දෙයක් රටේ නැත. එසේ තිබියදී තමන්ගේ දැඩි විරෝධයට හේතු වූ ඒක්සත් ජාතික පක්ෂ රජය කාලයට අයත් මේ සමූහ මිනී වල සම්බන්ධයෙන් නෑසූ කන්ව සිටින්නේ මන්දැයි තේරුම් ගැනීම ඒ තරම් අපහසු නැත.

මාතලේ සමූහ මිනීවලේ ඇට සැකිළි කියාපාන්නේ දරුණු වද දී මරා දැමූ තරුණයන් පිරිසක් පිළිබඳ අතිශය බිහිසුණු කතාවකි. මේ සමහර තරුණයන්ගේ හිස් නැත. අත් පා කපා දමා ඇත. සිරුරට ඇණ ගිල්වා ඇත. විදුලිය වද්දවා ඇත. මේ සා කුරිරු වද බන්ධනයකට ලක්කර මරා දැමුණ මේ තරුණයන් තරුණියන් වෙනුවෙන් සාධාරණය ඉටු විය යුතු ය. මේ ඝාතන පිලිබඳ නිසි පරීක්ෂණයක් පැවැත්විය යුතුය. ඒ සඳහා රජයට බල කෙරෙන වැඩ පිලිවෙලක් ඇති කළ යුතු ය. එසේ නොකර නිහඬව සිටීම අනාගතයේ තවත් මෙවන් අභාග්‍යසම්පන්න වාතාවරණයකට අතවැනීමක් වනු ඇති බව නිසැක ය.

සංස්කාරක

# සන්නස වසර අටක් සපුරයි




වෙහෙසකර ගමනක අතර මැද නැවතී ආපසු හැරී බැලීම ආශ්වාදය ගෙන දෙන්නකි. ආ මග පිළිබඳ නිසි වැටහීමක් ලැබෙන්නේ එවිට ය. පසුකර ආ සියළු බාධක කෙතරම් විසල් දැයි දැනෙන විට සිතට දැනෙන අභිමානය මිණිය නොහැකි ය.

සන්නස ආරම්භ කර වසර අටක් ගත වූ මේ මොහොතේ සන්නසේ ආරම්භයේ දී අප හා සිටි සාලිය ගලප්පත්ති හා ආනන්ද කුමාරසිරි

4 වන පිටට